# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 704 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 25/04/2024 පැය 0850

**මාධ්‍ය නිවේදනය**

**ශ්‍රී පාදස්ථානයේ ආරක්ෂක වැටෙන් පැන අතුරුදහන්ව සිටි පුද්ගලයා හමුවීම සම්බන්ධව - නල්ලතන්නිය පොලිස් ස්ථානය**

2024.04.17 වන දින ශ්‍රී පාදය වන්දනා කිරීමට පැමිණි වන්දනාකරුවන් පිරිසක් අතරින් ශ්‍රී පාදස්ථානය දක්වා ගමන් කරන පියගැටපෙළ අසල ආරක්ෂක වැටෙන් පිටතට පැන අතුරුදහන්ව සිටි දිවුල්ගහවත්ත, මහආර, සූරියවැව ලිපිනයේ පදිංචි වයස අවුරුදු 32 වන පුද්ගලයෙකු සෙවීම සඳහා සිරිපාගම පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය හා යුධ හමුදා නිලධාරීන් විසින් මෙහෙයුමක් ආරම්භකර තිබුණි.

ඒ අනුව 2024.04.24 වන දින නල්ලතන්නිය පොලිස් වසමේ රාජමලේ කොටස මරේවත්ත ප්‍රදේශයේ ඉහත අතුරුදහන් වූ පුද්ගලයා සිටින බවට ප්‍රදේශවාසීන් විසින් නල්ලතන්නිය පොලිස් ස්ථානය දැනුවත් කිරීමෙන් පසු පොලිස් නිලධාරීන් විසින් ඔහු දික්ඔය රෝහලට ඇතුලත් කර ඇත.

මෙම පුද්ගලයා ශ්‍රී පාදස්ථානය ආරක්ෂක වැටෙන් පැනීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර නල්ලතන්නිය පොලිසිය හා සිරිපාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**